# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.07 පැය 2220 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/672/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කාර්‍ය බලකායේ 82 වන මූලික පුහුණු පාඨමාලාවේ විසිර යාමේ සමාප්ති උත්සවය - විශේෂ කාර්‍ය බලකා කටුකුරුන්ද කඳවුර.**

පොලිස් විශේෂ කාර්‍ය බලකායේ 82 වන මූලික පුහුණු පාඨමාලාවේ විසිර යාමේ උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.04.07 වන අද පස්වරුවේ පොලිස් විශේෂ කාර්‍ය බලකා කටුකුරුන්ද පුහුණු පාසලේදී පැවැත්විණි.

82 වන පොලිස් විශේෂ කාර්‍ය බලකා පුහුණු පාඨමාලාව ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් 118 දෙනෙකු හා ආධුනික පොලිස් කොස්තාපල්වරුන් 231 දෙනෙකුගෙන් සමන්විතව කණ්ඩ 08 ක් යටතේ මූලික පුහුණුව හදාරා ඇත.

මෙහිදී පුහුණු පාඨමාලාවේ දක්‍ෂතම ආධුනික උප පොලිස් පරීක්ෂකවරයා ලෙස එම්.එම්.ආර්. පෙරේරා නිලධාරියාද දක්ෂතම ආධුනික පොලිස් කොස්තාපල්වරයා ලෙස ආධුනික පොලිස් කොස්තාපල් 105475 ඩබ්.එම්.එස්.ඩී.යූ. ධර්මසිරි නිලධාරියාද පිදුම් ලැබීය. මෙම කණ්ඩ 08 අතරින් සෑම අතින්ම විශිෂ්ඨතම කණ්ඩය ලෙස පොලිස් පරීක්ෂක තේජ ගුණසේකර මහතා යටතේ පුහුණුව ලැබූ 05 වන කණ්ඩ තිළිණ දිනා ගන්නා ලදී.

තවද, පාඨමාලාවේ අති ශූර ශාරීරික යෝග්‍යතා නිලධාරියා ලෙස ආධුනික පොලිස් කොස්තාපල් 105633 ආර්.කේ.වයි.පී.පී. රාජමන්ත්‍රී, T-56 අවිය හසුරුවමින් පාඨමාලාවේ අති දක්ෂ වෙඩික්කරු ලෙස ආධුනික පොලිස් කොස්තාපල් 105864 එච්.ඩී.කේ.ටී. ගුණරත්න, M - 16 අවි හසුරුවමින් පාඨමාලාවේ අති දක්ෂ වෙඩික්කරු ලෙස ආධුනික උප පොලිස් පරීක්ෂක ඩබ්.අයි.එම්. පෙරේරා, පිස්තෝල අවි හසුරුවමින් පාඨමාලාවේ අති දක්ෂ වෙඩික්කරු ලෙස ආධුනික උප පොලිස් පරීක්ෂක ඕ.ජී.සී.ජේ. සෝමසූරිය යන විශේෂ දක්ෂතා දක්වන ලද නිලධාරීන් හට සහතිකපත් හා සම්මාන පිරිනැමීම ගරු ජනාධිපතිතුමන් අතින් සිදු කෙරිණි. අනතුරුව පොලිස් විශේෂ කාර්‍ය බලකායේ නිලධාරීන් විසින් සංග්‍රාමික භූමියේ සිදුකරන මෙහෙයුම් සංදශර්නයක්ද ඉදිරිපත් කරන ලදී.

මෙම අවස්ථාවට මහජන ආරක්ෂක හා පාලර්මේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස, මහජන ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල, මහජන ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් රවී සෙනෙවිරත්න, වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය, පොලිස් විශේෂ කාර්‍ය බලකා අණදෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති සමන්ත ද සිල්වා, පොලිස් විශේෂ කාර්‍ය බලකා අධ්‍යක්ෂ පුහුණු, සහ කළුතර කලාප අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිශේධ ප්‍රනාන්දු යන මහත්වරුන් ඇතුළු උසස් නිලධාරීන් මෙන්ම පොලිස් නිලධරයන් හා විසිර යන නිලධාරීන්ගේ දෙමාපියන් ඇතුළු ඥාතීන් රැසක් ද සහභාගී වූහ.

උත්සවයට අදාල වීඩියෝ පටයක් සහ ඡායාරූප කිහිපයක්












S T F
WELCOME
INTAKE 82
SPECIAL TASK FORCE


නියතයි ජය
















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**